**ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව - 2022**

**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේවාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේත නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 61 වන ඡේදය හා ප්‍රමිත අංක 08 ප්‍රකාරව මුළුමනින්ම අගය ශූන්‍ය වූ එහෙත් තවදුරටත් භාවිතා කරන එකතුව රු.148,590,605 ක් වටිනා දේපල පිරියත උපකරණ අයිතමවල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේදී ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර වත්කම් ප්‍රත්‍යාගණනයක් කර ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07හි 31 ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අනාවරණය කර නොතිබුණි. | 2023 වර්ෂයේදී පොලී වලින් ලැබෙන මුදල් ප්‍රවාහය වෙනම අනාවරණව කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021 හා 2022වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් ලද රු.42,853,000ක් හා රු.40,000,000ක් ලෙස ලද රජයේ ප්‍රාග්ධන ප්‍රදාන පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 හි 28 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.තවද 2022 වර්ෂයේ ලද ප්‍රදාන අයභාර වියදම් සඳහා යොදාගෙන තිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. | ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන නොපියවූ අත්තිකාරම් ශේෂය රු .241,084 වුවද අත්තිකාරම් ලේඛනය අනුව එම වටිනාකම රු.491,825 ක් ලෙස දැක්වීමෙන් රු.250,741ක වෙනසක් නිරීක්ෂණ විය. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. අත්තිකාරම් ලෙජරයේ දෙසැම්බර් 31 දිනට ලබාගත් ශේෂ වැරදීමකින් අත්තිකාරම් ලේඛනයේ ජනවාරි මසට ගිණුම්ගතවීම නිසා මෙම වරද සිදුවී ඇත | උපලේඛන හා මූල්‍ය ප්‍රකාශන අතර ශේෂයන් සමාන විය යුතුය. |
| (ආ) | 2022 සැප්තැම්බර් 01 වන දින බදු ඔප්පුවක් මගින් අවුරුදු 20 ක කාලසීමාවක් දක්වා සුපිරි වෙළඳසැල් සංකීර්ණයක් සඳහා රු.1,014,090,300 ක් වටිනාකමට ගොඩනැගිල්ලක් බදු දී තිබූ අතර මෙම බදු දීමට අදාළව විගණනයේ ගණනය කිරීම් අනුව අත්තිකාරම් මුදල හා කුලී ආදායම පිළිවෙලින් රු.69,600,000ක් හා රු.7,500,000 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම පිළිවෙලින් රු.61,043,478 හා රු.6,521,739 ක් ලෙස දැක්වීම නිසා රු.9,534,783 ක වෙනසක් නිරීක්ෂණය විය. | **අත්තිකාරම් මුදල**<br>අත්තිකාරම් මුදල් ගණනයේදී දෙසැම්බර් මස රු.600,000 අත්තිකාරම් ගිණුමෙන් ආදායමට ලබා ගෙන නොමැත. එම වරද 2023 පෙබරවාරි මස නිවැරදි කර ඇත. ඉතිරි වෙනස සඳහා බලපා ඇත්තේ වැට් බදු මුදලය.<br>**කුලී ආදායම**<br>කුලී ආදායමෙන් 15%ක බදු මුදලක් වෙන් කර ඇති බැවින් රු.978,261 වෙනසක් ඇත. බදු කුලී සමග බදු මුදලක් ගිවිසුමේ ගණනය කර නොමැති නිසා මෙලෙස ගැලපීම් කිරීමට සිදු විය. | උපලේඛන හා මූල්‍ය ප්‍රකාශන අතර ශේෂයන් සමාන විය යුතුය. |
| (ඇ) | විකාශනාගාරයක් පවත්වාගෙන යාම සඳහා 2009 වර්ෂයේදී දීර්ඝකාලීන බදු පදනම මත ලබා ගත් ත්‍රිකුණාමලය කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් හෙක්ටයාර් 119.5309 ක් පමණ වූ ඉඩම සඳහා 2021 දෙසැම්බර් 31 දක්වා ගෙවිය යුතු බදු මුදල රු.153,860,000 ක්වූ අතර ඉන් රු.127,795,000 ක් කපා හැරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට රු.26,065,000 ක් ගෙවිය යුතු අතර 2022 වර්ෂය සඳහා වූ ගෙවිය යුතු රු.9,420,000 ක් ගිණුම්ගත කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල සංදේශ අනුව ත්‍රිකුණාමල, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඉඩම සඳහා ගෙවිය යුතු බදුකුලිය ගිණුම් ගත කර නොමැත. එය, ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කර තිබේ. | වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පැහැර හරිනු ලබන බදු අයකිරීමේ ඒකකයේ වාර්තා සහ සංස්ථාවේ බදු | විගණන නිරීක්ෂණය නිවැරදිය 2023 වර්ෂයේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නිවැරදි වටිනාකම දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් සම්බන්ධ බදු ගිණුම් අනුව 2022 දෙසැම්බර් 31දිනට මුළු බදු වගකීම රු.213,349,232 ක් (දඩ මුදල් රහිතව) විය යුතු වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වගකීම් යටතේ එය රු.180,091,971 ක් ලෙස දැක්වීමෙන් ගෙවිය යුතු හිඟ බදු වටිනාකම රු.33,257,261 ක් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඉ) | 2022 ජනවාරි 01දිනට ගුවන් කාල ණයගැතියන්ගේ ආරම්භක ශේෂය වූ රු.21,108,283 ක් හා 2021 දෙසැම්බර් 31 දිනට වූ රු.18,039,450 ක ශේෂය අතර රු. 3,068,825ක වෙනසට හේතු අනාවරණය කර ගැනීමට සංස්ථාව අපොහොසත් විය. | 2021 වර්ෂයේ ණය ගැති උපලේඛනයේ සිදු වූ වරදකි. 2022 වර්ෂයේදී ඉදිරිපත් කළ ණයගැති උපලේඛනය නිවැරදිය. | උපලේඛන හා මූල්‍ය ප්‍රකාශන අතර ශේෂයන් සමාන විය යුතුය. |
| (ඊ) | මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ගුවන් කාල ණයගැති එකතු වටිනාකම රු.281,690,050 ක් සඳහා රු.137,435,663 ක් අඩමාණ ණය වෙන් කර තිබුණද ,වෙනත් ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු ආදායම් වලට අදාළ රු.13,485,732 ක් සඳහා බොල් හා අඩමාණ ණය වෙන් කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. 2023 වර්ෂයේ සිට සියලු ණය ගැතියන් සඳහා අඩමාණ ණය වෙන් කරනු ලැබේ. | සියලු ණය ගැතියන් සඳහා බොල් හා අඩමාණ ණය වෙන් කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම උචිත වේ. |
| (උ) | විකාශනාගාරයක් පවත්වාගෙන යාම සඳහා බදු පදනම මත ලබාගෙන තිබුණු ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හෙක්ටයාර 0.3194 කට අදාළව නීතිපති විසින් අනුමතකර තිබෙන ක්‍රමවේදයට අනුව 1995 සිට 2017 දෙසැම්බර් 31 දක්වා ගෙවිය යුතු බදු කුලිය රු.10,969,208 ක් සමාලෝචිත වර්ෂය දක්වා ගිණුම්ගත කර නොතිබුණි. 2018, 2019, 2020, 2021 හා 2022 වර්ෂවලට අදාළ ගිණුම්ගත කර තිබුණු ගෙවියයුතු බදුකුලී රු. 6,075,000 ක් 2023 මැයි 31 වන විටද පියවා නොතිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදිය. මූල්‍ය තත්ත්වය අයහපත් නිසා ගෙවීමට නොහැකි විය. | වත්කම් වගකීම් නිවැරදිව ගිණුම් ගත කර නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඌ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2022 වර්ෂයට අදාළ උපචිත වියදම් රු.2,738,026 ක් ගිණුම්ගත කර නොතිබුණි . | 2022 ගිණුම් වර්ෂයට අදාළව 2023-01-10 වන විට ලැබී තිබූ ගෙවිය යුතු සියලු වියදම් උපචිත | උපචිත වියදම් නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ |

| | | | |
|---|---|---|---|
| | | වියදම් ලෙස ගිණුම් ගත කොට ඇත. ඒ අනුව රුපියල් 322,659,847 මුදලක් 2022-12-31 වන දිනට උපචිත වියදම් ලෙස ගිණුමෙහි දක්වා ඇත. විගණනයෙහි පෙන්වා දී ඇති ගෙවීම් වවුචර් මුදල් අංශයට ලැබී ඇත්තේ ඉහත කාලපරිච්ජේදයට පසුව වේ. | යුතුය. |
| (එ) | දේපල පිරියත හා උපකරණ සඳහා වූ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ මෝටර් රථ සමුච්චිත ක්ෂය වෙන්කිරීම රු.53,863,675 ක් වූ අතර 2022 ජනාවරි 01 දිනට පැවැති ශේෂය රු.52,786,363ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල ක්ෂය ප්‍රමාණය රු .1,077,313ක් වෙන් කළ යුතු වුවත් එම වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි. | විගණනය පෙන්වා දී ඇති කරුණු පිළිබඳව පරීක්ෂා කර 2023 වර්ෂයේ දී ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ක්ෂය වෙන් කිරීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |
| (ඒ) | තෙන්මරාච්චි නාවට්කුලි යන ස්ථානයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් විකුණුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල යාල් එෆ්.එම් සේවය සඳහා මිලදී ගැනීමට වාරික 03කින් එනම් රු.මි 2 ක් 2022 අප්‍රේල් 15 දින ද ,රු.මි 1.5 ක් 2022 මැයි 15 දිනද සහ රු.මි 1.5 ක් 2022 ජුනි 15 දිනද ලෙස රු.මි. 5ක් ගෙවීමට 2022 පෙබරවාරි 25 දින ගිවිසුම්ගත වී තිබුණි. ඉන් 2022 නොවැම්බර් 03 දින රු.මි 2 ක් ගෙවා තිබූ අතර ඉතිරි මුදල් ගෙවා නොතිබුණි .ඒ අනුව ගොඩනැගිලි ශේෂය රු.මි 3ක්, ණයහිමි ශේෂය රු.මි.3ක් හා ප්‍රමාදවීම නිසා අයකරන පොලිය රු.680,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි . | විගණන නිරීක්ෂණය නිවැරදිය. | ගොඩනැගිලි ශේෂය ණයහිමි ශේෂය හා පොලී මුදල නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඔ) | සංස්ථාව විසින් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායකය පිළිබඳව නිසි අවධානය යොමු නොකිරීම හේතුවෙන් ත්‍රිකුණාමල විකාශනාගාරයේ සේවයේ නියුක්තිකයන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට යැවිය යුතු රු.12,714,678ක් නොයැවීම නිසා | විගණන නිරීක්ෂණය නිවැරදිය. සංස්ථාව විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇති බැවින් වෙන් කිරීම් සිදුකරන නොමැත. | සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සංස්ථාවට එරෙහිව නඩු පවරා තිබුණි. එම මුදල ගෙවීමට 2021 ජනවාරි 17 දින මහේස්ත්‍රාත් අධිකරණයෙන් නියෝග කර තිබුණද එම වගකීමට අදාළව ඇගයීමක් කර සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි. | | |
| (ඕ) | 2023 වර්ෂයට අදාළ රු.1,565,604 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස දක්වා තිබුණි. | වවුචර අංක pay -1388-12 සහ අංක pay-1274-12 යටතේ විගණනයේ පෙන්වා දී ඇති කරුණ නිවැරදිය.<br>රු. 658, 350 ක වරිපනම් සදහා ගෙවූ වියදම 2023 වර්ෂයේ පළමු කාර්තුවට අදාළව වියදමකි. එම වියදම 2022 වර්ෂයට අදාළ නොවේ. ඒ අනුව මෙම ගිණුම් ගත කිරීම් සියල්ල නිවැරදිව ගිණුම් ගත කර ඇත. | වියදම් අදාළ වර්ෂයට නිවැරදිව ගිණුම්ගත කළ යුතුය |

**1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| (අ) | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | | | | | |
| | ණයගැති ශේෂය | 18,192,625 | 13,758,998 | 4,433,627 | මෙම ණයගැති හා ණයහිමි ශේෂ පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට ලැබේ | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම අනුරූපී වාර්තා අනුව වටිනාකම සමාන විය යුතුය |
| | ණයහිමි ශේෂය | 1,939,040 | ශේෂයක් නොමැත | 1,939,040 | | |
| | ජාතික ලොතරැයි මණ්ඩලය | | | | | |
| | ණයගැති ශේෂය | 6,514,210 | ශේෂයක් නොමැත | 6,514,210 | | |
| | ණයහිමි ශේෂය | 565,573 | ශේෂයක් නොමැත | 565,573 | | |
| (ආ) | තොගය | 31,400,885 | 29,405,407 | 1,995,478 | විගණන නිරීක්ෂණය නිවැරදිය. 2023 වර්ෂයේ ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරනු | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් අනුරූපී වාර්තා සමග |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | ලැබේ. | සැසඳිය යුතුය. |
| (ඇ) | ලැබිය යුතු තැන්පතු ශේෂය | 9,242,462 | 9,287,782 | 419,680 | විගණන නිරීක්ෂණය නිවැරදිය විගණන හා කළමනාකරණ තීරණ වලට අනුව කමිටුවක් පත්කොට මෙම ශේෂ සම්බන්ධ වාර්තාවක් කැඳවා ඇත. එහි තීරණය අනුව මෙම ශේෂය 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කිරීමට යොදා ඇත. | තැන්පතු ශේෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ඉඩම් | 7,574,763 | හිමිකම් ඔප්පු, වටිනාකම සනාථ කෙරෙන ලියවිලි, ස්ථාවර වත්කම් ලේඛනය හා භෞතික සත්‍යාපන වාර්තා | විගණන නිරීක්ෂණය නිවැරදිය. | වත්කම් වල හිමිකාරිත්වය හා පැවැත්ම තහවුරු කෙරෙන ලියකියවිලි සහ ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ගොඩනැගිලි | 433,223,877 | ස්ථාවර වත්කම් ලේඛනය, වටිනාකම සනාථ කෙරෙන ලියවිලි සහ භෞතික සත්‍යාපන වාර්තා | විගණන නිරීක්ෂණය නිවැරදිය. | වත්කම් වල හිමිකාරිත්වය හා පැවැත්ම තහවුරු කෙරෙන ලියකියවිලි සහ ලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ලංකා පුවත් ආයතනයේ කොටස් සඳහා ආයෝජනය . | 1,000,000 | කොටස් සහතික | විගණන නිරීක්ෂණය නිවැරදිය. | ශේෂ තහවුරු කිරීම සඳහා අදාළ සාක්ෂි ඉදිරිපත් කළයුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | රඳවුම් බදු | 23,232,695 | රඳවුම් බදු සහතික | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | පැවැත්ම තහවුරු කෙරෙන ලියකියවිලි සහ ලේඛන ඉදිරිපත් කළ යුතුය |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට ගුවන් කාල ණයගැති ශේෂය රු. 281,690,050 ක් වූ අතර ඉන් වර්ෂ 10 ඉක්ම වූ දේශීය ණයගැතියන් රු.31,873,561 ක් හා විදේශීය ණයගැතියන් රු.63,114,642 ක් විය. එය මුළු ගුවන් කාල ණයගැති ශේෂයෙන් සියයට 34 කි. තවද මෙම විදේශ ණයගැති ශේෂය තුල හඳුනාගත නොහැකි රු.35,301,041 ක් වූ ශේෂයක් ඇතුලත්ව තිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.1974 වර්ෂයට පෙර සිට පැවත එන ණයගැති ශේෂයන් අයකර ගත නොහැක. ශේෂ කපා හැරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය ව්‍යාපරය පොදු කාරක සභාවෙන් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව පරිදි මුදල් අංශය, අලෙවි අංශය හා අභ්‍යන්තර විගණක අංශය කමිටුවක් පත් කර කපා හැරියේ ලේඛනය සමබන්ධයෙන් පරීක්ෂා කර සංස්ථා මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත. | අයකර ගත යුතු ශේෂය අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | වැඩ තහනමකට ලක්ව පසුව උසාවියෙන් වරදකරුවකු වූ නිලධාරියකුට ගෙවූ රු.954,664 ක අඩ වැටුප් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන තිබුණද එම මුදල සංස්ථාව වෙත ලබා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.<br>මුදල් අයකරගැනීම සඳහ කටයුතු කරන ලෙස සංස්ථා මණ්ඩල තීරණයක් ලබාදී ඇත. | වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අදාල මුදල අයකර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කළ යුතුය |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ අවසානයට වටිනාකම රු.64,055,395 ක් වූ ලැබිය යුතු අනෙකුත් ආදායම් ශේෂ තුළ ඇතුළත් වර්ෂ 2 ත් 11 ත් දක්වා පැරණි එකතු වටිනාකම රු.10,106,956 ක් වූ ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදීද සංස්ථාව කටයුතු කර නොතිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | පැරණි ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වසර 35 කට වඩා වැඩි කාලයක සිට ඉදිරියට එමින් පවතින රු.238,952 ක් වූ වැඩිපුර ගෙවන ලද සේවක අර්ථසාධක අරමුදල් ශේෂයක් 2023 මැයි 31 වන විටත් සංස්ථාව වෙත නැවත පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය | අර්ථසාධක අරමුදල් ශේෂය පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.13,187,918 ක් වූ විවිධ ණයගැති වටිනාකම තුළ ඇතුළත් වර්ෂ 2ත් 21ත් අතර කාලයක් ගත වී තිබූ රු.4,829,121 ක් වූ විවිධ ණයගැති ශේෂය නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය | විවිධ ණයගැති ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2022 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය වූ රු.281,690,050 ක් තුළ වසර 3 කට වඩා වැඩි අය කර ගත යුතු ශේෂය රු.115,771,219 ක් විය. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | ණයගැතියන්ගෙන් අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතුය. |
| (උ) | 2022 දෙසැම්බර් 31 දින රු.1,005,482 වූ අගරු චෙක්පත් වලින් අප්‍රේල් 30 වන විට අයවී තිබුණේ රු.85,000 ක මුදල් පමණි. මෙම ඉතිරි මුදල් වූ රු.920,482 ක මුදල අය කර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | අගරු චෙක්පත් මුදල අය කර ගැනීමට සංස්ථාව කටයුතු කළයුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ගෙවිය යුතු 1981 සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළ එකතුව රු.149,420,035 ක් වර්ෂ 40 ක කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව පැවතුණු අතර විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.145,614,269 ක් විය. ගෙවිය යුතු එම ශේෂය 2023 මැයි | විගණන නිරීක්ෂණය නිවැරදිය. | දිගු කලක් පවතින උපචිත වියදම්වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

31 වන විටද පියවා නොතිබුණි.

### 1.6.3 අත්තිකාරම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 9.1 මඟින් සංශෝධනය කරන ලද මු.රෙ.371(2) (ආ) සහ 371(5) අනුව සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 155කදි ලබා දි තිබූ වටිනාකම රු.6,031,660 ක් වූ අත්තිකාරම් පියවිම කාර්යය නිමකර දින 10 ඉක්මවා දින 11 ත් දින 714ත් අතර ප්‍රමාදයකින් යුක්තව සිදුකර තිබුණි. | රු 5300 ක අත්තිකාරම් මුදල 2023 මුල් කාර්තුවේ පියවීමට කටයුතු කොට ඇත.අත්තිකාරම් පියවීමේදී චක්‍රෙල්ඛ අංක ප්‍රකාරව අදාළ කාලපරිච්ජේදය තුළ පියවීමටනොහැකි වනුයේ එම කාර්යයේ ස්භාවය හා ලංකාව පුරා විසිරී ඇති ප්‍රාදේශීය සේවා හා විකාශනාගාර සදහා නිකුත් කරන අත්තිකාරම් ප්‍රධාන කාර්යයාලය තුළින් පමණක් සිදු කිරීම නිසාය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 9.1 මඟින් සංශෝධනය කරන ලද මු.රෙ.371(2) (ආ) සහ 371(5) අනුව මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිම ලබා දිය හැකි වුවද අවස්ථා අවස්ථා 21 කදී එම සීමාව ඉක්මවා එකතුව රු.4,643,500 ක අත්තිකාරම් ලබාදීමට කටයුතු කර තිබුණි. | කාර්යයේ ස්භාවය අනුව සීමාව ඉක්මවා අත්තිකාරම් ලබාදීමට සිදුවන අවස්ථා පැනනගින අතර ඒ සදහා සභාපති හා අධ්‍යක්ෂ ජනරාල්ගේ විශේෂ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මාණ්ඩලික නිවේදන අංක : එස්.එල්.බී.සී/3142 හි 04 වන වගන්තිය අනුව යම් නිලධාරියෙකු ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීමට පෙර නැවත අත්තිකාරම් නොදිය යුතු වුවද ඊට පටහැනිව සංස්ථාව විසින් සමලෝචිත වර්ෂයේදී නිලධාරීන් 26 දෙනෙකුට අවස්ථා 126 කදී ක් ලබාගත් අත්තිකාරම් රු.5,082,646 ක් පියවීමට පෙර නැවත ලබාදී තිබුණි. | ගුවන් විදුලි නාලිකා 13 ක් පැවතීම, ප්‍රාදේශීය විකාශනාගාර ක් 11 පැවතීම, ප්‍රාදේශීය සේවා 07 ක් පැවතීම මත අත්තිකාරම් නිකුත් කිරීමට හැක්කේ විධායකශ්‍රේණියේ නිලධාරීන්ට පමණක් වීම නිසා සහ කාර්යයන්හි ස්භාවය අනුව අත්තිකාරම් නිකුත් කළ හැකි නිලධාරීන් සීමිත බව නිසා මෙලස අත්තිකාරම් නිකුත් කිරීමට සිදුවී ඇත.මෙලෙස අත්තිකාරම් සිදු කිරීම සිදු නොකලහොත් ආයතනයේ මෙහෙයුම් කාර්යයන්ට බලපෑමක් සිදුවේ. නිකුත් කළ සියලු අත්තිකාරම් පියවා ගැනීමට නිවැරදි ගිණුම්කරණ | ලිඛිත උපදෙස් අනුව කටයුතු කර රජයේ මුදල් නිසි කළමනාකරණයකින් පරිහරණය කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | | පාලන ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු යොදා ඇත. | |
| (ඇ) | අත්තිකාරම් ලබා දීමේදී අවශ්‍යතාවය හඳුනාගෙන ඊට අදාළ අත්තිකාරම් ලබාදිය යුතු වුවද අවස්ථා 8 ක දී රු.182,900 ක් වූ ලබාගත් අත්තිකාරම් වැය නොකර නැවත පියවා තිබූ බව නිරීක්ෂණය විය. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | අත්තිකාරම් ලබා දීමේදී අවශ්‍යතාවය හඳුනාගෙන ලබාදිය යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මුදල් රෙගුලාසි 396(ඇ) (i) හා (iii) | 2022 දෙසැම්බර් 31 දින වන විට වලංගු කාලය මාස 06 ඉක්ම වූ රු.604,539 ක් වටිනා චෙක්පත් 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ වන විට මෙය නිවැරදි කෙර ඇත. | මාස 06 ඉක්මවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ)(i) හා (iii) ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| | (ii) මුදල් රෙගුලාසි 395(ඇ) | එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කර, මුදල් රෙගුලාසි 395(ආ) ප්‍රකාරව එම බැංකු සැසඳුම විගණනය කිරීමට සූදානම්ව තිබිය යුතු වුවද සංස්ථාවේ බැංකු ගිණුම් 08 ක ජනවාරි සිට සැත්තැම්බර් දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දින විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සියලුම බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර විද්‍යුත් තැපැල මගින් ඉදිරිපත් කරන ලදි. මෑදු පිටපත් මේ සමග ඉදිරිපත් කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය | ඉදිරිපත් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම එක් එක් ක්‍රියාකාරකම සඳහා | විගණන නිරීක්ෂණ නිවැරදිය. | මාර්ගෝපදේශයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ මාර්ගෝපදේශය | නිශ්චිත කාල ඉලක්කයන් දක්වා නොතිබුණි. | | |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක : 01/2020,හි “රාජ්‍ය මුදල් සහ භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ පරිශීලනයට පහසු ආකාරයට සංගෘහිත කිරීම” යන චක්‍රලේඛයේ II කොටසේ 6.2 | සංස්ථාව විසින් අවස්ථා 10 කදී දින 90 ඉක්මවූ කාලයකට බඳවා ගැනීම් සිදුකර තිබුණි. බඳවා ගැනීමට අදාළ ගෙවීම් සිදුකළ යුත්තේ අදාළ කාර්යය ඉටු කළ පසුව අමාත්‍යාංශ ලේකම්ගේ පෞද්ගලික අනුමැතිය මත වුවද සංස්ථාව විසින් පැවරුම් පදනම මත බඳවාගෙන තිබූ නිලධාරීන් 07 දෙනෙකුට 2022 වර්ෂයේ සැප්තැම්බර් මස දක්වා පමණක් රු.2,424,937 ක මුදලක් කාර්යය ඉටු කිරීමට පෙර මාස් පතා ගෙවීම් සිදුකර තිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ඈ) | 1978දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි (2)502 ප්‍රකාර එහි II වැනි පරිශිෂ්ටය | සංස්ථාව සතු ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | විගණන නිරීක්ෂණය නිවැරදි වේ. 2023 වර්ෂයේ සිට ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (ඉ) | 2021නොවැම්බර් 16 දින මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි 6.7 අනුව | ස්ථාවර වත්කම් සහ ගබඩා සඳහා වාර්ෂික වත්කම් සත්‍යාපනයක් සිදුකළ යුතු වුවත්, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්ථාවර වත්කම් සහ ගබඩා සම්බන්ධයෙන් 2022 වර්ෂය සඳහා එවැනි පරීක්ෂණයක් විගණිත දිනය දක්වා සිදුකර නොතිබුණි. | ගබඩා සඳහා වාර්ෂික වත්කම් සත්‍යාපනයක් සිදු කර විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 2022 වාර්ෂික සත්‍යාපනය 60% ක පමණ ප්‍රමාණයක් අවසන් කර ඇත. ප්‍රමාණාත්මක වශයෙන් බාහිර සේවාවන් හා විකාශනාගාර 17ක් සහ | මෙහෙයුම් අත්පොතෙහි 6.7 විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රධාන කාර්යාලයෙන් උප ඒකකයන් 58ක ස්ථාවර වත්කම් පරීක්ෂාව සිදු කල යුතුව ඇත. මේ සඳහා වෙනත් අංශවල රාජකාරී කරන නිලධාරීන් යොදා ගනු ලබන අතර සමීක්ෂණ කටයුතු සඳහා සැලකිය යුතු කාලයක් ගතවීම මෙහි සීමාකාරී සාධකයක් ලෙස හඳුනා ගෙන ඇත. | |
| (ඊ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 ඡේදය | ගිණුම් වර්ෂය ආරම්භයට දින 15කට පෙර උපායමාර්ගික සැලස්ම පිළියෙල කර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා භාණ්ඩාගාර ලේකම්ට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සංස්ථාව විසින් ඒ පරිදි කටයුතු කර නොතිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (උ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ (1) (ඉ) ප්‍රකාරව | විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාල සීමාවක් තුල සියලු විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමට ගණන්දීමේ නිලධාරී වගබලා ගතයුතු වුවත් සංස්ථාවේ විගණන විමසුම් 2 ක් සඳහා 2023 ජූනි 30 වනවිටත් පිලීතුරු ලබා දී නොතිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය | විගණන විමසුම්වලට පිළිතුරු ලබා දිය යුතුය. |

### 1.8 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයට පෙර සිට පැවත එන මහජන බැංකුව ඉතිරි කිරීම් ගිණුමෙහි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.56,282,019 ක මුදලක් පැවති අතර, ඒ සඳහා සියයට 2.5ට වඩා අඩු පොළී අනුපාතයක් යටතේ රු.2,133,619ක පොලියක් ලැබී තිබුණි. තවද සංස්ථාවේ ප්‍රධාන ජංගම ගිණුමෙහි (2323265) 2022 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශය අනුව අයිරා ශේෂය රු.51,726,039ක් වූ අතර ඒ සඳහා අය කළ පොලිය රු.4,679,352 ක් විය. සංස්ථාවේ මුදල් 2.5 අනුපාතයකට වඩා වැඩි පොලී අනුපාතයක් යටතේ ආයෝජනය කිරීමට අවධානය යොමු නොකිරීම හෝ බැංකු අයිරාව පියවීමට කටයුතු නොකිරීමෙන් ලැබෙන පොලී ආදායමට වඩා රු.2,545,733 ක් අයිරා පොලිය වැඩි වීමෙන් මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි. තවද 2012 වර්ෂයට පෙර සිට පැවත එන නේෂන්ට්‍රස්ට් බැංකුවේ ජංගම ගිණුමද උපරිම ඵලදායි ලෙස යොදා නොගෙන 2022 දෙසැම්බර් 31 දිනට රු.17,761,729 ක් නිශ්ක්‍රීයව මුදල් තබා ගෙන තිබුණි. | මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමෙහි පවතින මුදල් සංස්ථාවට හදිසි මිලදී ගැනීම් සඳහා මෙම මුදල් අවශ්‍ය වන බැවින් මෙම මුදල ස්ථාවර තැන්පතුවක් නොදමන ලදි. විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. ප්‍රධාන ජංගම ගිණුමෙහි (2323265) හි බැංකු අයිරා පොලිය ගෙවීමට සිදු විම නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ජංගම ගිණුමේ මුදල 2023 අප්‍රේල් මස මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමට මාරු කරන ලදී. | මූල්‍ය පාලනය කිරීම සඳහා නිසි පරිදි කටයුතු කළයුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව උපචිත වියදම රු.322,659,847 ක් වූ අතර එයින් රු.223,507,075 ක් වූ උපචිත වියදම් සඳහා උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. තවද මෙම උපචිත වියදම තුළ වර්ෂ ගණනාවක සිට පැවතෙන රු.228,606,286 ක් වූ ශේෂද ඇතුළත්ව තිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. රු. 841,819.00 කොන්ත්‍රාත් සේවක වැටුප් ලේඛනය ලබාදිය හැක. | උපචිත වියදම්වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. රු.222,665,256 සඳහා උපලේඛන ඉදිරිපත් කළයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය (බදු පෙර) රු.236,388,563 ක අලාභයක් වූ අතර ඊට අනුරූප වර්ෂයේ ලාභය රු.11,487,241 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.247,875,804 ක පසුබෑස්මක් නිරීක්ෂණය විය. මෙම පසුබෑස්මට රජයේ ප්‍රදාන නොලැබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.49,243,983 කින් වැඩිවී තිබූ අතර පරිපාලන, බෙදාහැරීම සහ අනෙකුත් මෙහෙයුම් වියදම් රු.22,056,072 කින් අඩුවී තිබුණි.එම තත්ත්වය තුලද සමාලොචිත වර්ෂයේදී බදු පසු ලාභය රු. 119,224,883 කින් පසුබෑස්මක් වී තිබීමෙන් (රාජ්‍ය ප්‍රදාන රහිතව) භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහයක් නොමැතිව සංස්ථාව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවක් පවතින බව නිරීක්ෂණය විය.

### 2.3 අනුපාත විශ්ලේෂණය

(අ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ජංගම අනුපාතය 1.04 සිට 0.6 දක්වාද ක්ෂණික අනුපාතය 1 සිට 0.56 දක්වා විශාල පසුබෑස්මක් පෙන්නුම් කෙරුණි. ජංගම වත්කම්හි ඇතුළත් ණයගැතියන් තුළ වර්ෂ 10 ඉක්ම වූ පැරණි දේශීය ණයගැතියන් රු.31,873,561ක් විදේශීය ණයගැතියන් රු. 63,114,642 ක් ද , ජංගම වගකීම්හි උපචිත වියදම තුළ වර්ෂ ගණනාවක සිට පැවත එන රු.228,606,286 ක් ඇතුළත්ව තිබුණි. තවද ශුද්ධ කාරක ප්‍රාග්ධනය රු. 21,143,543 ක ධන වටිනාකමක සිට රු. 282,878,479 ක ඍණ වටිනාකමකට අඩුවීම නිසා සංස්ථාව කෙටිකාලීන නුබුන්වත්භාවය පිළිබඳ ගැටළුවට මුහුණු දී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මෙහෙයුම් ලාභ අනුපාතය ඍණ 52.05 සිට ඍණ 33.89 දක්වා ප්‍රතිශතයකින් වර්ධනය වී තිබූ අතර විකුණුම් ආදායම 7.78 ප්‍රතිශතයකින් ඉහළ යාමත්, පරිපාලන වියදම් 6.19 ප්‍රතිශතයකින් හා වෙනත් මෙහෙයුම් වියදම් 1.16 ප්‍රතිශතයකින් පහළ යාම මීට හේතුවී තිබුණි. තවද සංස්ථාව දිගින් දිගටම මෙහෙයුම් අලාභ ලබා තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)(i) | සංස්ථාවේ ඉදිරිපස නව ගොඩනැගිල්ල 2022 සැප්තැම්බර් 01වන දින බදු ඔප්පුවකින් සුපිරි වෙළඳසැල් සංකීර්ණයක් සඳහා වසර 20ක කාලසීමාවක් සඳහා රු. 1,014,090,300 වටිනාකමට බදු දී තිබුණි. මේ සඳහා එක් පුවත්පතක පමණක් දැන්වීම් පලකර තිබුණි. දැනටමත් රු.මි.3 ක | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. සංස්ථාවේ පැවති මුදල් තත්ත්වය පදනම් කර ගනිමින් රාජ්‍ය ආයතනයක් වන ලේක්හවුස් ආයතනයේ Sunday observe මගින් ඉරිදි පුවත්පතේ මෙම දැන්වීම් වලට කිරීමට කටයුතු කරන ලදි. මෙම කටයුත්තක් ද සිදු කරනු ලැබුවේ ණය පදනම් මතය. මීට අමතරව සංස්ථා | නිවැරදි තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර සංථාවට පාඩු නොවන පරිදි කටයුතු කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ආරම්භක කුලියකට ලබාදී තිබූ මෙම ගොඩනැගිල්ල හා රථගාල සඳහා ලබාගෙන තිබූ තක්සේරු වාර්තාවේ ගොඩනැගිල්ලේ හා රථගාලේ වර්ග ප්‍රමාණය කොපමණද යන්න නොදක්වා මාසිකව රු.මි.2 කට දියහැකි බව පමණක් දක්වා තිබුණි. නමුත් පුවත්පත් දැන්වීමේ දක්වා තිබුනේ පර්චස් 10 ක් ලෙසය. විගණනය හා ආයතනයේ නිලධාරීන් විසින් 2023 ජූනි 02 දින කළ ස්ථානීය නිරීක්ෂණය අනුව මෙම ප්‍රමාණය පර්චස් 123.06 ක් පමණ වූ බව තහවුරු වූයෙන් පුවත්පත් දැන්වීමේ අඩු වර්ග ප්‍රමාණයක් දක්වා තිබීමත්, නිවැරදි තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු නොකිරීමත් නිසා සංස්ථාවට නිවැරදි වර්ග ප්‍රමාණය අනුව ලබා ගැනීමට නියමිතව තිබූ බඳුකුලී අගයන් උපයාගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි. | වෙබ් අඩවිය තුල මෙම දැන්වීම් පළ කරන ලදි. | |
| (ii) | උක්ත බදු ගිවිසුමෙහි සංස්ථාවට අවාසි සහගත ලෙස වූ 6 (g) වගන්තිය අනුව ලැබෙන මාසික කුලී ආදායමෙන් කොටසක් එකතු කළ අගය මත බදු සඳහා වෙන් කිරීමට සිදුවී තිබීම නිසා (එකතු කළ අගය මත බදු 15% ක් ලෙස ඉදිරි වර්ෂ වලදී ද වෙනස් නොවන ලෙස සැලකුවහොත් ) ගිවිසුම් ගත කාලය අවසන් වන 2042 වර්ෂය වන විට සංස්ථා බදු ආදායමෙන් රු.132,272,648 ක් එකතු කළ අගය මත බදු ගෙවීමට සිදුවීමෙන් එම කුලී ආදායම සංස්ථාවට අහිමිවීමේ අවධානමක් පවතී. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය | බදු ගිවිසුම සංශෝධනය කරගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | මෙම ගිවිසුම අනුව ලැබුණු අත්තිකාරම් මුදල රු.මිලියන 72 වුවද 6 (g) වගන්තිය නිසා රු.9,391,304 ක මුදලක් එකතු කළ අගය මත බදු ලෙස වෙන්කර තිබුණි. ගිවිසුමේ 3(ii) a වගන්තිය පරිදි මෙම අත්තිකාරම මාසිකව රු.600,000 ක් බැගින් මාස 120 කින් බදු කුලී මුදලින් හිලව් කිරීමට එකඟ වි තිබුණ ද, ගිණුම්ගත කළ මුළු අත්තිකාරම රු.62,608,696 ක මුදලක් වන බැවින් රු.600,000 බැගින් වාරික 120 වෙන් කිරීම ගැටලු සහගතය. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | බදු ගිවිසුම සංශෝධනය කරගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | ඉක්මනින් අලුත්වැඩියා කල යුතු තත්ත්වයේ පවතින ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන සම්ප්‍රේෂණ කුලුන සහ ක්ෂුද්‍ර තරංග කුලුන රු.4,605,256 කට අලුත්වැඩියා කිරීමට 2019 නොවැම්බර් 06 දින ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබී තිබුණද 2023 අප්‍රේල් 30 දින වනවිටත් අලුත්වැඩියා කර නොතිබුණි. එම හේතුවෙන් ආයතනය මඟින් විකාශන වැඩසටහන් මෙහෙයවීම අවදානම් තත්ත්වයට පත් වී තිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | ඉක්මනින් අලුත්වැඩියා කල යුතුය. |
| (ඇ) | 2004 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සංස්ථාව සතුව පැවති රු.16,980,329ක් වටිනා රැඳවුම් බදු සහතික වටිනාකම ආදායම් බදු වෙනුවෙන් කාලාවරෝදයට පෙර හිලව් කර ගැනීමට සංස්ථාව කටයුතුකර නොතිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | රැඳවුම් බදු ආදායම හිලව් කර ගැනීමට සංස්ථාව කටයුතු කළයුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාව 2012 වර්ෂයෙන් පසු භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීමට පෙර දිගින් දිගටම අලාභ ලබා තිබූ අතර පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම නිසා එම අලාභ අවම කර ගැනීමට අවස්ථාව ලැබී තිබුණි. 2021 වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීමට පෙර රු.මි. 333.5 ක් වූ අලාභය රු.මි. 345 ක ප්‍රතිපාදන ලැබීම නිසා රු.මි. 11.5 ක ලාභයක් බවට පත් වූ අතර 2022 වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් එම අලාභය රු.මි. 236.4 ක් විය. මේ සඳහා වෙනත් ආදායම් මාර්ග මඟින් ආදායම් වර්ධනය කර ගැනීමේ අභිලාශයෙන් සංස්ථාවේ ගොඩනැගිලි හා ඉඩම් බදු දීමට සංස්ථාව කටයුතු කර තිබුණි. නමුත් සංස්ථාවේ ප්‍රධාන කාර්යය වන ගුවන් කාලය විකිණීම ඉහළ නැංවීම මඟින් මූල්‍ය තත්ත්වය ඉහළ නැංවීමත්,ආයතන හා පරිපාලන වියදම් පාලනය කිරීමෙන් නැවත ලාභ ලබන තත්ත්වයකට පත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව සංස්ථාව විසින් අවධානය යොමුකර නොතිබුණි. | ඌණ උපයෝගී වත්කම් උපයෝගී කරගෙන රජරට වැය බරක් නොමැති ලාභාංශ ලබාදෙන ආයතනයක් ලෙස නැගී සිටීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරමින් 2022 වර්ෂයේ නව ගොඩනැගිල්ලේ කොටසක් බදු පදනම මත ලබාදීමට කටයුත කර ඇත. ත්‍රිකුණාමලය, කුච්චවේලි ඉඩම සූර්ය බල ව්‍යාපෘතියක් සඳහා යොගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. නුවරඑළිය නිවහන ඒකාබද්ධව පවත්වාගෙනයාමට කටයුතු ආරම්භ කර ඇත. වසර ගණනාවක් මුලුල්ලේ ආයතනයට නොලැබී ගිය මොරටුව විශ්වවිද්‍යාලයෙන් අයවිය යුතු රුපියල් මිලියන 125ක මුදලක් ලබාගැනීමට කැබිනට් පත්‍රිකාවක් යොමු කර ඇත. | වෙනත් ආදායම් මාර්ග මඟින් ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කළයුතුය. |
| (ආ) | සංස්ථාව විසින් ලංකා පුවත් ආයතනයෙහි කොටස් මිලදී ගැනීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව 1993 වර්ෂයේදී රු.1,000,000 ක් ආයෝජනය කර තිබුණු නමුත් 1993 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වාම කිසිදු ලාභාංශ ආදායමක් ලැබී නොතිබුණි. | විගණන විමසුම සමග එකඟ වේ. | ආයෝජන සම්බන්ධයෙන් සොයා බලා ප්‍රතිලාභ ලබාගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (ඇ) | 2007 මැයි 11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2007/09අනුව වයස අවුරුදු 67 සම්පූර්ණ කළ කිසිවෙකු නැවත රාජ්‍ය සේවයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරකට පත් | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොකළ යුතු වුවද සංස්ථාව විසින් දැනට වයස අවුරුදු 68 ක් හා 81ක් සම්පූර්ණ කරන ලද පුද්ගලයින් දෙදෙනෙකු පත්වීම් ලිපියක්ද නිකුත් නොකර 2010 වර්ෂයේ සිට මේ වන තෙක් පැවරුම් පදනම මත සේවයේ යොදවා තිබුණි. | | |
| (ඈ) | 2020 ජුනි 29 දින පැවති සංස්ථා මණ්ඩල රැස්වීම් අංක 03/2020 (ii) තීරණ අංක 04.03පරිදි සියලුම අලෙවි විධායකයින්ගේ මාසික ඉලක්කගත ආදායම රුපියල් මිලියන 03 දක්වා වර්ධනය විය යුතු බව සංස්ථා මණ්ඩලය තීරණය කර තිබුණ ද 2022 ඔක්තෝබර් , නොවැම්බර් මාසවල අලෙවි නිලධරයන්ගේ අලෙවි ඉලක්කය මිලියන03 ක් වී නොතිබුණි . එමෙන්ම 2022 ඔක්තෝබර් මාසයේ ලබාදුන් ඉලක්ක සම්පූර්ණ කිරීමට නිලධාරීන් 15 දෙනෙකුගෙන් 12දෙනෙකුම සමත්වී නොතිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | සංස්ථා මණ්ඩල රැස්වීම් අංක 03/2020 (ii) තීරණ අංක 04.03පරිදි කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2022 වර්ෂය සඳහා අයවැයගත විකුණුම් ආදායම රු.1,040,210,000 ක් වූ අතර, 2022 වර්ෂයේ තත්‍ය විකුණුම් ආදායම රු. 682,086,556 ක් විය .ඒ අනුව අයවැයගත ආදායමෙන් රු.358,123,444 ක් ළඟාකර ගැනීමට සංස්ථාවේ අලෙවි අංශය අසමත් වී තිබුණි. එම ප්‍රමාණය අයවැයගත විකුණුම් ආදායමෙන් 34 %ක් විය. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | අයවැය ගත ආදායම සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | මූල්‍ය ප්‍රකාශන අනුව 2022 වර්ෂයට පෙර ලැබිය යුතු ශේෂය රු. 163,164,250 ක් වුවද නීතිමය පියවර ගෙන තිබුණේ රු. 12,890,287 ක ණය අය කර ගැනීමට පමණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළයුතුය. |
| (උ) | ගුවන් විදුලි සංස්ථාවට නීත්‍යානුකූල අයිතියක් නොමැති භූමියක 2018 වර්ෂයේ රු. 5,830,890 ක් පිරිවැයක් දරා කඳුරට සේවයට අදාළ ගොඩනැගිලි ඉදිකර තිබූ | වසර 30කට අධික කාලයක් මුළුල්ලේ ගුවන්විදුලි සංස්ථාව වෙත ලබාදී තිබෙන භූමියේ මෙම ගොඩනැගිල්ල | භූමිය නීත්‍යානුකූලව පවරාගැනීමට හෝ විධිමත්ව නිරාකරණය කර ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතර එම භූමිය නීත්‍යානුකූලව පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිකිරීමට කටයුතු කර ඇත. පසුව පුෂ්පදාන විද්‍යාලය මගින් එම ගොඩනැගිල්ල සාදා තිබෙන ඉඩම ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමට අදාලව ජනමාධ්‍ය අමාත්‍යාංශය, පුෂ්පාදන විද්‍යාලය, මහනුවර ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග රැස්වීමක් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පැවැත්වූ අතර මේ පිළිබඳව තීරණයක් නොමැතිව මාස 6ක කාලයකට කල් තබන ලදී. | |
| (ඖ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි II කොටසෙහි 5.1 ඡේදය ප්‍රකාරව සියලුම රජයේ ආයතන, තම ආයතනය විසින් සේවාවන් සඳහා අයකරන ගාස්තු සමාලෝචනය කර වසර තුනකට වරක් සියයට 15 ක උපරිමයකට යටත්ව සංශෝධනය කළයුතු වුවද සංස්ථා විසින් ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළද රු.102,312,983 ක් දක්වා ගාස්තු ආදායම් ලබාගැනීමට සංස්ථාව අවධානය යොමුකර නොතිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. 2020, 2021, 2022 වර්ෂවල ගාස්තු වැඩිකිරීමක් සිදුකර නොමැත. 2020 ආරම්භයේ ලෝකයේ ඇති වූ කොරෝනා වංසගතය හේතුවෙන් ආයතනය පවත්වාගෙන යාම විනා වාර්ෂික ගාස්තු වැඩිවීමක් හෝ විශේෂ ක්‍රියාකාරකමක් සිදුවී නොමැත. 2023 මාර්තු 31 දින දක්වාම ගාස්තු සියයට 20කින් ඉහළට දැමීමට කටයුතු කර නොමැත. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |
| (එ) | ගනුදෙනුකරුවන් වැඩසටහන් වෙනුවෙන් කලින් මුදල් ගෙවූ අවස්ථාවල අදාල වැඩසටහන් නියමිත දිනට කිරීමට අපහසු වූ විට ඒ වෙනුවෙන් 2015 වර්ෂයේ සිට ලද මුදල් රු.37,402,395 ක් ගුවන් කාල ණයහිමියන් ලෙස පැවති අතර එම මුදල් සුදුසු පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2022 වර්ෂයේ ඉදිරි ලැබීම් සියල්ල සඳහා ගුවන්කාල ආදායම ලබා දී ඇත.ඉතිරි මුදල් සඳහා 2023 වර්ෂයේදී කටයුතු කරනු ලැබේ. | වැඩසටහන් නොපවැත්වූ අවස්ථාවලට අදාළව ලැබී තිබූ මුදල් ආදායම බැර කිරීමට හෝ ආපසු ගෙවීමට කටයුතු කළයුතුය. |
| (ඒ) | හෝමාගම ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් ගුවන් විදුලි සම්ප්‍රේෂණාගාරයක් සෑදීම සඳහා ලද අක්කර 149 රූඩ් 02 පර්චස් 22 | 2007 වර්ෂයෙන් පසු ගිණුම් පරීක්ෂා කර බලා වැරදි ලෙස ගිණුම් ගත කර ඇත්නම් පරීක්ෂා කර බලා | නියමිත කාර්යයෙන් බැහැරව යොදා නොගත යුතුය. |

| | | |
|---|---|---|
| ක ඉඩම සංස්ථාවට පවරාදීම් සහතිකයේ ii උපලේඛනය ප්‍රකාරව "ඉඩම ගුවන් විදුලි සම්ප්‍රේෂණාගාරයක් සෑදීම සඳහා පමණක් පවරා දෙනු ලැබේ" යනුවෙන් සඳහන් වීම හා එම කාර්යයෙන් බැහැරව ඉඩම යොදා ගත නොහැකි බවත්, නියමිත කාර්යයෙන් බැහැරව යොදා ගතහොත් ඉඩම ආපසු භාරදිය යුතු බවට දන්වා තිබුණි. නමුත් ගුවන් විදුලි සංස්ථාව විසින් එම අරමුණෙන් බැහැරවී 2007 දෙසැම්බර් 17 දින මොරටුව විශ්ව විද්‍යාලයේ තාක්ෂණ විද්‍යා පීඨය ඉදිකිරීම සඳහා රු.25,000,000ක අත්තිකාරමක් ලබාගෙන තිබුණි. | ඒ පිළිබඳව 2023 වර්ෂයේදී ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | |

**3.3 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 ත් 2019 ත් අතර කාලය තුළදී සංස්ථා සේවයෙන් වෙනත් ආයතන වෙත මුදාහළ නිලධාරීන්ගෙන් සංස්ථාවට ලැබිය යුතු රු.2,236,895 ක් අයකර ගැනීමට 2023 මැයි 31 දින විටත් කටයුතු කර නොතිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | වෙනත් ආයතන වෙත මුදාහළ නිලධාරීන්ගෙන් සංස්ථාවට ලැබිය යුතු මුදල අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවේ වතු පාලක තනතුරේ සේවයේ යෙදී සිට 2021 දෙසැම්බර් 10 දින වයස අවුරුදු 60සම්පූර්ණ වීම හේතුවෙන් විශ්‍රාම ගිය නිලධාරියකු 2021 දෙසැම්බර් 13 සිට නැවතත් ඔහුට පැවරුම් පදනම මත සේවයට බඳවා ගැනීමට සංස්ථාව කටයුතු කර තිබුණි 2022 .මාර්තු 14 දින පැවති සංස්ථා මණ්ඩල රැස්වීමේදී මෙම නිලධාරියාගේ සේවය පැවරුම් පදනම මත ලබා ගැනීමට | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | සේවය පැවරුම් පදනම මත ලබා ගැනීම නීතිමය විධිවිධාන අනුව කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාණ්ඩාගාර නියෝජිතවරිය ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ නොවී තිබූ අතර, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිරීක්ෂකවරියද ඒ සඳහා එකඟ වී නොතිබුණි. එසේ වුවද සංස්ථා මණ්ඩලය විසින් මෙම නිලධාරියාගේ සේවය පැවරුම් පදනම මත ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. | | |
| (ආ) | සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අධ්‍යක්ෂ (අලෙවි) තනතුරු 01 ක් පමණක් ඇතුළත්ව තිබුණ ද 2021 , ජුනි 01 දින සිට 2022 මැයි 31 දක්වා කාලය තුල අධ්‍යක්ෂ (අලෙවි) තනතුරෙහි ස්ථිර පදනම මත හා කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් දෙදෙනෙකු අනුමත කාර්ය මණ්ඩලයට පටහැනිව සංස්ථාව විසින් සේවයේ යොදවා තිබුණි .ඒ අනුව සංස්ථාව විසින් අනුමත එක් තනතුරක් වෙනුවෙන් නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් එම කාලය තුළදී ගෙවා තිබූ මුදල රු.3,872,920 ක් විය. තවද අධ්‍යක්ෂ (අලෙවි) ලෙස කටයුතු කළ නිලධාරියා අලෙවි අංශයේ රාජකාරි වලින් 2021 ජුනි 01 දින සිට 2021 ජුනි 27 දක්වා නිදහස් කර තිබුණු කාලය සඳහා වෙනත් රාජකාරි පැවරීමක් ද සිදු කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණද ඔහුගේ ජුනි මස වැටුප ලෙස රු.182,505ක් ගෙවා තිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | අනුමත තනතුරු සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතුය. |
| (ඇ) | සංස්ථාවේ කාර්ය මණ්ඩලය තුල තෘතීය මට්ටම, ද්විතීය මට්ටම සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු සඳහා පිළිවෙලින් සේවකයින් 57 ක්, 95 ක් සහ 61 ක් ලෙස අතිරික්ත සේවකයින් සංඛ්‍යාවක් සේවයේ යොදවා ගෙන තිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | අනුමත තනතුරු සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික වාර්තාව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දින 10 ක ප්‍රමාදයක් සහිතව 2023 මාර්තු 10 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | විගණනයේ නිරීක්ෂනය නිවැරදිය.<br>2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව මුද්‍රණයේ පවතින අතර, මැය මස 31 දිනට ඉදිරිපත් කිරීමට හැකියාවක් පවතී. | මෙහෙයුම් අත්පොතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය. |

### 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 නොවැම්බර් 25 දින විගණනය වෙත ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්මේ 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය සැලකීමේදී ක්‍රියාකාරී සැලැස්ම තුළ අංශ 22 ක් ඇතුළත් වී තිබුණු අතර අංශ 14 ක ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබුණි. තවද අලෙවි අංශයේ ආදායම් වර්ධනය කර ගැනීමේ අරමුණින් හඳුන්වා දුන් වැඩසටහන් 17 ක් පවත්වා නොතිබුණි. | විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. | ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය ඉදිරිපත් කළ යුතුය. |